මහා සභාව
**2022-03-10**

# වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂයේ / 49 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව -කෙටුම්පතකි

### 2022-03-10

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
8. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
9. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
10. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
11. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
12. ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
13. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
14. ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රමාලතා මහත්මිය
15. ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
16. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
17. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
18. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
19. ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
20. ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
21. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
22. ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
23. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
24. ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
25. ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
26. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
27. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා

28. ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය
29. ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
30. ගරු මන්ත්‍රිනී එම්.එම්.මේරි වාලට් කුරේ මහත්මිය
31. ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි වමෝදරී ප්‍රනාන්දු මහත්මිය
32. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
33. ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
34. ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුහසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01.2022-02-10 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

තීරණ අංක 01

**2022-02-10 වන දින පැවති මහා සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.**

ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව 23 වන පිටුවේ " 2022.02.06 මෙම නිරීක්ෂණයට ආදායම් පරීක්ෂක උපාලි ජයවික්‍රම මහතාද,චමින්ද නිරෝශන් මහතාද,දිසේනකා වාසල මහත්මියද සහභාගී වූ බවත්, ඔවුන්ගේ වාර්තාව ගරු සභාපතිතුමා මහා සභාවට ඉදිරිපත් කරන ලදී." ලෙස සඳහන් වන බවත්, එම ලිපිය ගරු මන්ත්‍රීවරුන්ට නොලැබුණ බවත්, එය මන්ත්‍රීවරුන්ගේ ලිපි ගොණු වලට ඇතුළත් විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. එය ලබාදෙන ලෙසටද ඉල්ලා සිටින ලදී.

එය ලැබීමට සලස්වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

### 01.නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 02

මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
- ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
- ගරු මන්ත්‍රී එම්.ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා
- ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය
- ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
- ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
- ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
- ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා
- ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 03

2022 ජනවාරි මස,පෙබරවාරි මස සහ මාර්තු මස පැවති පහත සඳහන් කාරක සභා සඳහා **සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**2022 පෙබරවාරි මස 22 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 5. | ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2022 මාර්තු මස 02 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝධාභය වික්‍රමසිංහ මහතා |
| 6. | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2022 පෙබරවාරි මස 03 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 3. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 4. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |

**2022 පෙබරවාරි මස 24 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 2. | ගරු මන්ත්‍රී කේ.ඒල්.සී.කුමාර කරුණානායක මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා |
| 4. | ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී වි.කේ.එම්. අසන්ත කුලසේකර මහතා |

**2022 ජනවාරි මස 31 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී එල්.කේ .ජගත් ප්‍රියංකර මහතා |
| 2. | ගරු මන්ත්‍රී කේ. නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩබ්.ඒ. රෙන්ෆ්‍රිඩ් ෂවින් ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී ආර්.පී. අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| 6. | ගරු මන්ත්‍රී ඩබ්. සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |
| 7. | ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා |
| 8. | ගරු මන්ත්‍රිනි ආර්.පී. නදීකා රණවිර මහත්මිය |

02. මින් ඉදිරියට සංක්ෂිප්ත වාර්තාවක් සකස් කරමුයැයිද, මහා සභා රැස්වීම අවස්ථාවට ලබාදෙන වාර්තා රැගෙන යන ලෙසත්,කීපදෙනෙකු පමණක් මහා සභා වාර්තාව සම්පූර්ණයෙන්ම කියවා පැමිණෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මන්ත්‍රීවරුන් ලබාදෙන ලිපි රැගෙන යන බවත්,නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ ලිපි ඉතිරි වන බවත්, ගරු මන්ත්‍රීවරුන් මෙහිදී අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලදී.

සභාවේ සාකච්ඡා කරන ප්‍රධාන කොටස පමණක් වාර්තාවට ඇතුළත් කරමුයැයිද අනෙකුත් දෑ ඇතුළත් නොකර සංෂිප්ත වාර්තාවක් සකස් කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මහා සභා වාර්තාව යනු සභාවේ මූලික ලියවිල්ල බැවින් එය වැදගත් වාර්තාවක් බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ඉතිරි කිරීමට සියළුම දෙනා පුරුදු වෙමුයැයි තමන් දැනුවත් කල බවත් ඉදිරියේදී අරපිරිමැස්මෙන් කටයුතු කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

03. අද දින සභාවට නිල වශයෙන් ගිනි නිවන රථයක් ලැබුණ බවත්, හදිසි ගින්නක් නිවීමට ගිනි නිවන රථයක් මෙතෙක් සභාව සතුව නොතිබුණ බවත්, එවැනි හදිසි අවස්ථාවලට ප්‍රායෝගිකවම මුහුණ දුන් බවත්, මහල් 04ක උසට ගිනි නිවිය හැකි රථයක් අද දින සභාවට ලැබුණ බවත් ප්‍රකාශ කරන ලදී.වෙන්නප්පුව ව්‍යාපාරික ගොඩනැඟිලි හිමියන්ගේ සංගමයේ සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාට ගරු සභාපතිතුමා විසින් ස්තූතිය පුද කල අතර එම ගෞරවනීය ස්තූතිය ලිපියක් මඟින් දැනුම් දෙන ලෙසටද යෝජනා කරන ලදී. අද වන විට වෙළඳපොල වටිනාකම බැලූ විට මෙවැනි රථයක් ලක්ෂ 25ක වඩා වැඩි බවත්, සියළුම උපාංග සහිතව වාහනයේ හිමිකාරිත්වය සභාවට ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. මෙය මුළු බල ප්‍රදේශයටම වටිනා සම්පතක් බවත් ඒ සඳහා රු.1000ක් බදු මුදල් ලබා ගන්නා ලෙසට සංගමයම යෝජනා කල බවත් මෙම කටයුත්ත නිවැරදිව ස්ථාපිත කිරීමට මාසයක් පමණ ගත වන බවත්, මේ සඳහා පළාත් පාලන අමාත්‍යාංශයෙන් වෙනම ඒකකයක් ලෙස මෙය ස්ථාපිත කල යුතු බවත් මේ සියල්ලම ලේකම් මහතාට භාර දී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙහි ඉදිරි වැඩ කටයුතු සියල්ල ඊළඟ මහා සභාවට යොමු කරන බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 04

වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවට වෙන්නප්පුව ව්‍යාපාරික ගොඩනැඟිලි හිමියන්ගේ සංගමය විසින් ලබා දුන් ගිනි නිවීමේ රථය සඳහා සභාවේ ගෞරවනීය ස්තූතිය පුද කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ඒ සඳහා ලබාදෙන ලදී.

04. කසල කලමනාකරණයේදී එකතු වන අතු කැබලි හා දිරාපත්වීමට දීර්ඝ කාලයක් ගන්නා කාබනික ද්‍රව්‍යය කැබලි කිරීම සඳහා යන්ත්‍රයක් සභා අරමුදලින් මිලදී ගැනිමට පසුගිය දිනක හැකි වූ බවත්, එය කිරිමැටියාන කොම්පෝස්ට් අංගනයේදී පසුගිය දිනක ක්‍රියාත්මක කිරීමට හැකි වූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.එමෙන්ම මෙවැනි යන්ත්‍ර ඉදිරි කාලයේදී උපකාර්යාල වලද ස්ථාපිත කිරීමට තමන් සූදානම් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

05. පසුගිය දින වල වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා වෛද්‍යාධාර හා නිවාස අධාර බෙදාදීම සිදු වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ගරු සභාපතිතුමා ස්තූතිය පුද කරන ලදී,

06. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත සමඟ කියවිය යුතු 2020-10-29 දින අංක 2199/15 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (අතිවිශේෂ) පල කරන්නට කටයුතු කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අංක 06 ප්‍රකාරව 2023 වර්ෂය සඳහා වන අයවැය සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා පුවත්පත් දැන්වීමක් මඟින් මහජනතාවගෙන් නව සංවර්ධන යෝජනා 2022 ජුනි 30 වන දිනට පෙර ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

තීරණ අංක 05

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත සමඟ කියවිය යුතු 2020-10-29 දින අංක 2199/15 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (අතිවිශේෂ) පල කරන්නට කටයුතු කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අංක 06 ප්‍රකාරව 2023 වර්ෂය සඳහා වන අයවැය සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා පුවත්පත් දැන්වීමක් මඟින් මහජනතාවගෙන් නව සංවර්ධන යෝජනා 2022 ජුනි 30 වන දිනට පෙර ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී.

07. 2022 පෙබරවාරි මස පහත සඳහන් මාර්ග ප්‍රිමික්ස් අතුරා නඩත්තු කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ගරු සභාපතිතුමා ස්තූතිය පුද කරන ලදී.

| අ/අ | වැඩ විෂය | දිනය | ඡන්ද කොට්ඨාසය | වැය වූ මුදල රු. |
|---|---|---|---|---|
| 01 | රතු බෝක්කුව පාර | 2022.02.02 | කහටවිල | 32,289.39 |
| 02 | මැටිකොටුව පාර | 2022.02.09 | මෝරුක්කුලිය | 32,602.85 |
| 03 | දමින්න මහතාගේ නිවස පාර | 2022.02.10 | කිරිමැටියාන | 31,938.06 |
| 04 | පල්ලිය පාර | 2022.02.11 | කම්මල | 31,037.79 |
| 05 | කොරියන් සිංහ ගම්මාන පාර | 2022.02.14 | කම්මල | 31,201.86 |
| 06 | මැටිකොටුව පාර | 2022.02.15 | දංකොටුව | 31,655.08 |
| 07 | බ/සූසේ පාර | 2022.02.17 | කොළින්ජාඩිය | 29,288.89 |
| 08 | කටුකෙන්ද පාර | 2022.02.18 | කටුකෙන්ද | 31,575.78 |
| 09 | සියඹලාගහ පාර | 2022.02.21 | උ/වෙන්නප්පුව | 31,315.05 |
| 10 | ඩිස්පැන්සරිය වැල්ල පාර | 2022.02.24 | දුම්මලදෙණිය | 30,361.14 |
| 11 | ඩිස්පැන්සරිය වැල්ල පාර | 2022.02.25 | දුම්මලදෙණිය | 53,912.80 |

## 03.යථා පරිදි කල් දී ඇති යෝජනා

## a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. වෙන්නප්පුව සෙමනේරියවත්ත නිවාස ක්‍රමයේ අනවසරකරුවන් නියමානුකූල කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ලබා දීම සම්බන්ධයෙන් ගරු මහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

| |
|---|
| තීරණ අංක 06<br><br>වෙන්නප්පුව සෙමනේරියවත්ත නිවාස ක්‍රමයේ අනවසරකරුවන් නියමානුකූල කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී. |

ii. 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධිත) පනතේ 4(අ)1 වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සඳහා ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

මෙය නිරීක්ෂණය කිරීමට සිදු වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය ලේකම්, ගොවිජන සේවා හා වාරිමාර්ග යන කිසිඳු ආයතනයක් මෙම රක්ෂිත පිළිබඳව නොදන්නා බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.හෝටල්,නිවාස, කර්මාන්ත තිබෙන බවත් දැනටත් රක්ෂිත අත්පත් කරගෙන සිටින පිරිසක් සිටියහොත් කුමක් සිදුවේදැයිද විමසා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය තම අදහස් පළ කරන ලදී.

ඇළක ගැඹුර අනුව රක්ෂිතය තීරණය කල හැකි බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහි 7 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කල හැකි බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී වාරි මාර්ග දෙපාර්තමේන්තුව සමඟ සලකා බැලීමේදී අවමයක් ඉදිරිපත් කර තිබෙන බවත්, මෙය ඉඩම්හිමියන්ට ඉතාමත් සාධාරණ බවද ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මැල්වත්ත දියවර ගම්මානයේ හා මහායායවත්ත දෙක කොටස නමින් මිනිසුන්ට පදිංචියට බෙදා දී ඇති බවත්, එය මැනුම් නියෝගවලට ද යොමු වී නොමැති බවත්, ඒවායෙහි මේ වන විට ජනතාව ස්ථිර නිවාස සාදාගෙන සිටින බවද ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

යම් ඇළක් විවිර කිරීමට ගිය විට ඔවුන් නඩු දමන බවත්, එතැනින් එම කටයුතු නතර වන බවත්, නමුත් අවශ්‍යතාවයක් තිබුණහොත් පමණක් ඇළක් හාරන බවත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මැල්වත්ත ප්‍රදේශයේ මෙය ප්‍රබල ලෙස බලපාන බව ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.මෙයට තමන් විරුද්ධ නොවන බවත් නමුත් එක් පවුලක් හෝ ඉවත් කිරීමට සිදු වුවහොත් කුමක් සිදුවේදැයිද විමසා සිටින ලදී.

පදිංචිය තහවුරු වී තිබේනම් ගැටළුවක් නොමැති බවත්, මින් ඉදිරියට සිදු වන දේ වළක්වාගැනීමට මෙම යෝජනාව තිබෙන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එක් අයෙක් නිසා පොදුවේ බහුතරයට බලපෑමක් තිබේනම් ඒ සම්බන්ධව තීරණයක් ගැනීමට සිදු වන බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

සෝෂාව.....

ඇළ මාර්ග පසුව ගැසට් කර ගැනීමට කටයුතු කරමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 07

2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධිත) පනතේ 4(අ)1 වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

iii. දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉ/මොහොට්ටිමුල්ල ක්‍රීඩාංගණය " සමගි" පොදු ක්‍රීඩාංගණය ලෙස නම් කිරීම සඳහා ගරු සභාපතිතුමා  ගරු සභාවට යෝජනා කල අතර එම යෝජනාව කල් තබන ලදී.

iv. වෙන්නප්පුව  ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෝලාන ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇති නුරාණි කර්මාන්ත පුර ඉඩමේ පිහිටි ආර්.පී. ඉන්ඩස්ට්‍රීස් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම විසින් රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම පිණිස සභාවේ එකඟතාවය ලබා ගැනීමට ගරු සභාපතිතුමා ගරු සභාවට යෝජනා කරන ලදී.

රබර් ආශ්‍රිත ලෙස පැවසුවද මෙය ෆයිබර් ග්ලාස් වැඩපොලක් බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. මේ සඳහා ගමේ ජනතාව විරුද්ධ බවත්, කර්මාන්ත වලට අවසරය ලබා දීමේදී මෙවැනි ආයතන වලට ලබා දීම සුදුසු නොවන බවත්, මෙම ස්ථානයේ ඇඟලුම්ශාලාවක් වැනි කර්මාන්තයක් සිදු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කල අතර මෙම ආයතනය සඳහා විරෝධතාවය ලිඛිතවම සභාවට එවා ඇති බවද ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව නැවත තක්ෂණ නිලධාරී වාර්තාවක් ගෙන ඉදිරි කටයුතු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.

v.අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ආධාර ලබා දිමට එක් කොට්ඨාසයකට රුපියල් ලක්ෂය බැගින් කොට්ඨාස 25 සඳහා රුපියල් ලක්ෂ 25ක් වෙන් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

තීරණ අංක 08

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ආධාර ලබා දිමේ වැඩසටහන සඳහා  එක් කොට්ඨාසයකට රුපියල් ලක්ෂය බැගින් කොට්ඨාස 25 සඳහා රුපියල් ලක්ෂ 25ක් වෙන් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව  ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

vi. " ගම සමඟ පිළිසඳරක් 2022-මාර්ග සංවර්ධනය " යටතේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට සහ දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාර්ග සංවර්ධනය කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී. එමෙන්ම මෙය කර්මාන්ත කමිටුවට යොමු කරන බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 09

“ ගම සමඟ පිළිසඳරක් 2022-මාර්ග සංවර්ධනය ” යටතේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට සහ දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පහත සඳහන් මාර්ග සංවර්ධනය කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

| **වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | | |
|---|---|---|
| අ/අ | ග්‍රාම නිලධාරී වසම | අනුමත මාර්ගයේ නම |
| 01 | නැ/නයිනමඩම | ශාන්ත මරියා විදුහලේ පිවිසුම් මාර්ගයට තාර දැමීම |
| 02 | නැ/ලුණුවිල | කැරලයින් මහත්මියගේ නිවස පාර තර දැමීම |
| 03 | නැ/බොරලැස්ස | ඇලෝසියස් මහතාගේ නිවස අසල මාර්ගය තාර දැමීම |
| 04 | මැද උල්හිටියාව | කෝප්සිටිය ඉදිරිපිට පාර තාර දැමීම |
| 05 | උ/වෙන්නප්පුව | දවට ගහ මාවතේ ශාන්තිලාල්ගේ නිවස පාර සංවර්ධනය කිරීම |
| 06 | නැ/බොරලැස්ස | ඇලෝසියස් මහතාගේ නිවස අසල මාර්ගය තාර දැමීම |
| 07 | නැ/ලුණුවිල | කොට්ඨාමුල්ල අරලිය මාවත ඉතිරි කොටස තාර දැමීම |
| 08 | බ/වෙන්නප්පුව | ඉටගම මියගේ නිවස අසල මාර්ගය තාර දැමීම |
| 09 | ද/ලුණුවිල | 5 කොටස බුදු පිළිමය අසල මාර්ගය තාර දැමීම |
| 10 | ද/ලුණුවිල | ප්‍රියන්ත මහතාගේ නිවස අසල මාර්ගය තාර දැමීම |
| **දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | | |
| අ/අ | ග්‍රාම නිලධාරී වසම | අනුමත මාර්ගයේ නම |
| 01 | යෝගියාන | රුක්අත්තනගහවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය |
| 02 | උ/ඇටියාවල | සූරිය මාවත ප්‍රතිසංස්කරණය |
| 03 | ඉ/දුම්මලකොටුව | සෙබස්තියන් මහතාගේ නිවස පිහිටි මාර්ගය ප්‍රතිසංස්කරණය |
| 04 | පොතුවටවන | මැල්වත්ත පළමු හරස් මාර්ගය ප්‍රතිසංස්කරණය |
| 05 | බ/කහටවිල | වෙල මැද පාර ප්‍රතිසංස්කරණය |
| 06 | මැ/හාල්දඬුවන | විජයගම ජනපදය පළමු හරස් මාර්ගයේ 1 වන අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය |
| 07 | මැ/හාල්දඬුවන | විලානි පාර ප්‍රතිසංස්කරණය කිරීම |
| 08 | උ/හාල්දඬුවන | බොල්පනාවත්ත මාර්ගය ඉතිරි කොටස ප්‍රතිසංස්කරණය කිරීම |
| 09 | නැ/කටුකෙන්ද | පල්ලියවත්ත 3වන පටුමඟ ප්‍රතිසංස්කරණය කිරීම |
| 10 | මැ/ගෝනවිල | රජවත්ත ප්‍රජා ශාලාව පාර ප්‍රතිසංස්කරණය කිරීම |
| 11 | ගොඩැල්ල | පල්ලිය පිටුපස නුවන් ප්‍රින්ටර්ස් පාර ප්‍රතිසංස්කරණය කිරීම |
| 12 | උ/ගෝනවිල | සැනසුම උළු මෝල ඉදිරිපිට මාර්ගය ප්‍රතිසංස්කරණය |
| 13 | නැ/දංකොටුව | තිළිණ මාවත ප්‍රතිසංස්කරණය |

vii. හලාවත ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කේ.එච්.ඩී.පෙරේරා මහත්මියගේ අසනීප තත්ත්වය හේතුවෙන් එතුමියට වෛද්‍යාධාර ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී. එමෙන්ම මෙතුමිය අප සභාවේද මින් පෙර සේවය කල බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ මේවා ගරු මහා සභාවට ඉදිරිපත් කිරීමට පෙර ප්‍රජා සංවර්ධන කමිටුව වෙත යොමු විය යුතු බවයි. අප බල ප්‍රදේශයේ සියළුම රෝගීන්ගේ ඉල්ලීම් ලබා දී අවසන් වූ පසුව මෙය සලකා බලමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

viii. 2022 මාර්තු මස 10 වන දින සිට 20 වන දින දක්වා ඉන්දුනීසියාවේ ජකර්තා නුවර පැවැත්වෙන ජාත්‍යන්තර හොකී තරගාවලියට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා ජාතික හොකී කණ්ඩායම නියෝජනය කරන අප බල ප්‍රදේශයේ ක්‍රීඩකයින් 05 දෙනෙකු සඳහා ක්‍රීඩාවට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා මූල්‍ය ආධාරයක් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

මොවුන් පාසල මඟින් ඉදිරිපත් වෙදැයිද? මේ සඳහා විදුහල්පති නිර්දේශය ලැබී තිබේදැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

මෙය ක්‍රීඩා අමාත්‍යංශය මඟින් යොමු කරඇති බවත්,මේ සඳහා පාසලින් නිර්දේශයක් ගනිමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේද පිහිණුම් තටාකය විවිධ ක්‍රීඩා සමාජ මඟින් යොදා ගන්නා බවත්,මේ සඳහා විදුහල්පති නිර්දේශය අත්‍යවශ්‍යය බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මොවුන් පාසල් ගොස් අවසන්දැයිද නොදන්නා බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය ලබන ක්‍රීඩා කමිටුවට යොමු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ලිපියක් භාර ගැනීමේදී දිනය බලන ලෙසත්, නියමිත කාල සීමාවක් තිබිය යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ක්‍රීඩා කමිටුවට ගරු මන්ත්‍රීවරුන් සහභාගී වීමට අකමැති බවත්, එමඟින් ලබාගත් තීන්දු තීරණ ක්‍රියාත්මක නොවන බවත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ix. RS-1160 අංක දරණ අප සභාවේ JCB යන්ත්‍රයේ ආසනය මිල දී ගැනීම සඳහා රු.585,813.60ක මුදලක් වැය වන බවත් ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදෙන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

එය මිලදී ගන්නා ලෙසත් රියදුරු මහතාට කොන්දේ අමාරුව සෑදෙන බවත් ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 10

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් RS-1160 අංක දරණ JCB යන්ත්‍රයේ ආසනය රු.585,813.60ක මුදලකට Senok Trade Combine (Private) Limited – no:1, Wilimbula, Henegama යන ආයතනයෙන් මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

x.2022.03.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී වැඩිදුරටත් සාකච්ඡා කර අනුමත කරන ලද දංකොටුව නගර ශාලාවේ (ඉතිරි කොටස) සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති යෝජනාව හා එහි රු.මි.130ක ඇස්තමේන්තුගත මුදලින් රු.මි.50ක මුදල පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යංශයේ මූල්‍ය ප්‍රතිපාදන මඟින් සපයා ගෙන ඉතිරි රු.මි.80ක මුදල, 7%කට නොවැඩි වාර්ෂික පොලී අනුපාතයක් යටතේ දේශීය ණය සංවර්ධන අරමුදලෙන් සපයා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

මෙම නගර ශාලාවේ ඉතිරි වැඩ කොටස් සඳහා ඉංජිනේරු දෙපාර්තමේන්තුව මඟින් ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කර ඇති බවද එම නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඇස්තමේන්තු මුදලින් රු.එක්කෝටියක් පමණ අඩුකර ගත් බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ණය ගෙවීමේ ක්‍රමවේදය පිළිබඳව මෙහිදී ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටි අතර එය පසුව ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

තීරණ අංක 11

2022.03.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී වැඩිදුරටත් සාකච්ඡා කර අනුමත කරන ලද දංකොටුව නගර ශාලාවේ (ඉතිරි කොටස) සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති යෝජනාව හා එහි රු.මි.130ක ඇස්තමේන්තුගත මුදලින් රු.මි.50ක මුදල පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන මඟින් සපයා ගෙන ඉතිරි රු.මි.80ක මුදල, 7%කට නොවැඩි වාර්ෂික පොලී අනුපාතයක් යටතේ දේශීය ණය සංවර්ධන අරමුදලෙන් සපයා ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

xi. රටේ පවතින වර්තමාන තත්ත්වය තුළ අනවශ්‍ය වීථි පහන් නිවා දමා එම ජාතික යුතුකම ඉටු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

මේ පිළිබඳව පොදු පහසුකම් කමිටුවේ සභාපතිතුමා සමඟ සාකච්ඡා කල බවත්, ගරු මන්ත්‍රී මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීමට මහා සභාවට මෙම යෝජනාව යොමු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් තම අදහස් පල කරන ලදී.

පොදු පහසුකම් කමිටු සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ විදුලි පහන් අවශ්‍ය හා අනවශ්‍ය ස්ථාන පිළිබඳ නිරීක්ෂණය කර එම අනවශ්‍ය ස්ථාන වල විදුලි පහන් නිවා දැමීමට හෝ ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

සියළුම මංසන්ධි වල පමණක් විදුලි පහන් දල්වමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 12

පොදු පහසුකම් කමිටුවේ ගරු සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ විදුලි පහන් අවශ්‍ය අනවශ්‍ය ස්ථාන පිළිබඳව නිරීක්ෂණය කර එම අනවශ්‍ය ස්ථාන වලින් විදුලි පහන් නිවා දැමීම හා සුදුසු පියවර ගැනීම යෝග්‍ය බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

xii. සිරිගම්පල බුද්ධිදාන පෙර පාසලේ නව ගොඩනැඟිල්ල ඉදි කිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

දැනට තිබෙන ගොඩනැඟිල්ල හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී වැන්ඩලන් මහතා විසින් නායකත්වය ලබා දී ඉදිකල ගොඩනැඟිල්ලක් බවත්, එබැවින් අදාල රාජ්‍ය අමාත්‍යාංශය වෙත මෙය යොමු කල පසුව එය ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ නිර්දේශය මත අනුමත වී තිබෙන බවත්, අදාල ඉඩම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක් බැවින් මේ සඳහා ගරු සභාපතිතුමාගේ නිර්දේශයද මේ සඳහා ලබා දී ඇති බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.මෙම කටයුත්තට මැදිහත් වන ලෙසත් මෙය අත්‍යාවශ්‍ය ඉඩමක් බවත් තවදුරටත් පවසා සිටින ලදී.

තීරණ අංක 13

| |
|---|
| සිරිගම්පල බුද්ධිදාන පෙර පාසලේ නව ගොඩනැඟිල්ල ඉදි කිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන එම කටයුතු ඉක්මනින් සිදු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

## b.ගරු මන්ත්‍රී යෝජනා

**i.** **ලුණුවිල ශ්‍රී ධර්මවිජයාරාමය විහාරස්ථානයේ සංඝාවාසය සහ දාන ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

**මෙය ලුණුවිල නොව බණ්ඩිරිප්පුව ලෙස යෝජනාවේ වෙනස් විය යුතු බව** ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා ප්‍රකාශ කරන ලදී.

කොට්ඨාසභාර මන්ත්‍රීතුමා වන ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා මෙහිදී පවසා සිටියේ ආවාසගෙය වහලය ඉතාමත් පහළ මට්ටමින් තිබෙන බැවින් ස්වාමින්වහන්සේට සිටීමට අපහසු බවයි.ගරු රාජ්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේද ප්‍රතිපාදන මුදලින් ලක්ෂ 05ක් ලබා දෙන බැවින් තම ප්‍රතිපාදන මුදලින්දරු.ලක්ෂයක මුදලක් වෙන්කර ලබාදෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

මෙය ගරු ආණ්ඩුකාරතුමාට ඉදිරිපත්කර අනුමැතිය ලබාගත යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 14<br><br>බණ්ඩිරිප්පුව **ශ්‍රී ධර්මවිජයාරාමය විහාරස්ථානයේ සංඝාවාසය සහ ධාන ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා බණ්ඩිරිප්පුව කොට්ඨාසය සඳහා වෙන් කර ඇති මුදලින් රු.ලක්ෂයක මුදලක් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව වෙන්කර ලබා දීම සුදුසු බවට කොට්ඨාසභාර මන්ත්‍රී ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා යෝජනා කල අතර එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

**ii.** **බ/අංගම්පිටියේ ඇති පැරණි ළදරු පාසල සහ මාතෘ සායනයේ කොටසක් කඩා ඉවත් කර යෝජිත නව ගොඩනැඟිල්ලට අනුමැතිය ලබා ගැනීමට අදාලව සහ මිල ගණන් කැඳවා පැරණි ගොඩනැඟිල්ල මාර්තු 31ට පෙර ඉවත් කරවීම සඳහා ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

**මෙය බ/අංගම්පිටියේ තිබෙන පැරණි ළදරු පාසල බවත්, මේ සඳහා මුදල් ලැබී ඇති බවත්, ප්‍රාදේශීය සභාවේ ගොඩනැඟිල්ල ඉවත් කරදෙන ලෙසට අදාල ඉංජිනේරු මහතා විසින් පවසා ඇති බැවින් එය සිදු කරදෙන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා විසින් ප්‍රකාශ කරන ලදී.**

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවෙන් සිදු කරනු ලබන ළදරු පාසල හා එම භූමියේම සිදු කරනු ලබන මාතෘ සායනය එහි ස්ථාපිතව තිබෙන බවත්, මේ සම්බන්ධව ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා මැදිහත් වුවද දේවස්ථානය කැමැත්ත පළ කර නොමැති බවත්, මෙම ඉදි කිරීම කරන තෙක් දැනට ආසන්නව සිටින ගුරුතුමියගේ නිවසේ මෙම ළදරු පාසල පැවැත්වීමට සභාවේ අවසරය** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ඉල්ලා සිටින ලදී.මෙය සෑම විටම නිරීක්ෂණය කරන ලෙසද සියළු ගොඩනැඟිල්ල කඩා ඉවත් කල පසුව වැසිකිළි පද්ධතිය,ක්‍රීඩාපිටිය,ජල බැස්ම යන සියල්ල නිරීක්ෂණය කරන ලෙසටද ඉල්ලා සිටින ලදී.

**මේ සම්බන්ධව කමිටුවක් තිබෙන බැවින් එහිදී මේ සියල්ල සාකච්ඡා කල හැකි බව ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා විසින් ප්‍රකාශ කරන ලදී.**

**මෙම කටයුත්ත නිසි ලෙසම සිදු වේ නම් පමණක් ගොඩනැඟිල්ල කඩා ඉවත් කිරීමට හා මිල ගණන් කැඳවීමට කටයුතු කරමුයැයි** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 15

**බ/අංගම්පිටියේ ඇති පැරණි ළදරු පාසල සහ මාතෘ සායනයේ කොටසක් කඩා ඉවත් කර යෝජිත නව ගොඩනැඟිල්ල ඉදි කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවටත්, එතෙක් එම ළදරු පාසල ආසන්නව පදිංචි ගුරුතුමියගේ නිවසේ පැවැත්වීමටත්, එමෙන්ම මිල ගණන් කැඳවා පැරණි ගොඩනැඟිල්ල ඉවත් කිරීම සුදුසු බවටත් ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා යෝජනා කල අතර එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**iii.** 2022 අයවැය යෝජනා සඳහා දංකොටුව කොට්ඨාසයෙන් ලබා දී ඇති "බ/දංකොටුව සෙලින්කෝ වත්ත මාර්ගය පිළිසකර කිරීම "යන යෝජනාව වෙනුවට "උ/දංකොටුව විශ්‍රාමික මාවත පිළිසකර කිරීම" යන යෝජනාව ඇතුළත් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

**තීරණ අංක 16**

2022 අයවැය යෝජනා සඳහා දංකොටුව කොට්ඨාසයෙන් ලබා දී ඇති බ/දංකොටුව සෙලින්කෝ වත්ත මාර්ගය පිළිසකර කිරීම යන යෝජනාව වෙනුවට "උ/දංකොටුව විශ්‍රාමික මාවත පිළිසකර කිරීම" යන යෝජනාව ඇතුළත් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා යෝජනා කල අතර **එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**iv.** 2022 අයවැය යෝජනා සඳහා කහටවිල කොට්ඨාසයෙන් ලබා දී ඇති නැ/කහටවිල ග්‍රාමසේවා වසමේ මහායායවත්ත අංක 02 ජනපදයේ " පුස්තකාල භූමියෙහි ඉදි කෙරෙන ප්‍රජා ශාලාවෙහි ඉතිරි කොටස ඉදි කිරීම " යන යෝජනාව වෙනුවට එම වසමෙහි එම ජනපදයේම " ක්‍රීඩා පිටියේ ක්‍රීඩාගාරයේ ඉතිරි වැඩ කොටස නිම කිරීම"යන යෝජනාව ඇතුළත් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය **විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

**තීරණ අංක 17**

2022 අයවැය යෝජනා සඳහා කහටවිල කොට්ඨාසයෙන් ලබා දී ඇති නැ/කහටවිල ග්‍රාමසේවා වසමේ මහායායවත්ත අංක 02 ජනපදයේ " පුස්තකාල භූමියෙහි ඉදි කෙරෙන ප්‍රජා ශාලාවෙහි ඉතිරි කොටස ඉදි කිරීම " යන යෝජනාව වෙනුවට එම වසමෙහි එම ජනපදයේම " ක්‍රීඩා පිටියේ ක්‍රීඩාගාරයේ ඉතිරි වැඩ කොටස නිම කිරීම"යන යෝජනාව ඇතුළත් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය යෝජනා කල අතර **එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

v. ලුණුවිල මංසන්ධියේ සිට දකුණු දිශාවට ඇති මාර්ගයේ පුස්තකාලයට පෙර වම්පස අතුරු මාර්ගය "කිංස්ලි පෙරේරා" මාවත ලෙස නම් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

**තීරණ අංක 18**

ලුණුවිල මංසන්ධියේ සිට දකුණු දිශාවට ඇති මාර්ගයේ පුස්තකාලයට පෙර වම්පස අතුරු මාර්ගය "කිංස්ලි පෙරේරා" මාවත ලෙස නම් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින්** ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

vi. 2022 වර්ෂයේ අයවැය යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති "සියඹලාගහ පාර කෙලවර දකුණු පැත්තට පාර" යන යෝජනාව වෙනුවට "වෙන්නප්පුව කුරුස තොටුපල විදුලි සැපයුම් කුටිය කපරාදු කිරීම" යන යෝජනාව සහ "ශා.ජෝෂප් මාවතේ බටගොඩ නිවස පාර" යන යෝජනාව වෙනුවට "වෙන්නප්පුව ජපමාල මාවත සුසිලා මහත්මියගේ නිවස ඉදිරිපිට කාණුව සෑදීම" යන යෝජනාව ඇතුළත් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

තීරණ අංක 19

2022 වර්ෂයේ අයවැය යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති "සියඹලාගහ පාර කෙලවර දකුණු පැත්තට පාර" යන යෝජනාව වෙනුවට "වෙන්නප්පුව කුරුස තොටුපල විදුලි සැපයුම් කුටිය කපරාදු කිරීම" යන යෝජනාව සහ "ශා.ජෝෂප් මාවතේ බටගොඩ නිවස පාර" යන යෝජනාව වෙනුවට "වෙන්නප්පුව ජපමාල මාවත සුසිලා මහත්මියගේ නිවස ඉදිරිපිට කාණුව සෑදීම" යන යෝජනාව ඇතුළත් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

vii.උදාසිරිගම කොට්ඨාසයේ උ/සිරිගම්පල ශාන්ත තෙරේසාවත්ත අංක 07-ඒ කොටසේ හරස් මාර්ගය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරාගෙන නවීකරණය කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

තීරණ අංක 20

උදාසිරිගම කොට්ඨාසයේ උ/සිරිගම්පල ශාන්ත තෙරේසාවත්ත අංක 07-ඒ කොටසේ හරස් මාර්ගය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරාගෙන නවීකරණය කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

viii.වයික්කාල කොට්ඨාසයේ පරණ පාරින් ජේසුනසරේනු මාවතට හැරෙන තැන අනාථ අගල ඉහළින් ඉදි කෙරෙන බෝක්කුව සඳහා 2022 වර්ෂයේ වයික්කාල කොට්ඨාසය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන යෙදවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ඉල්ලීමට අදාලව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

තීරණ අංක 21

වයික්කාල කොට්ඨාසයේ පරණ පාරින් ජේසුනසරේනු මාවතට හැරෙන තැන අනාථ අගල

ඉහළින් ඉදි කෙරෙන බෝක්කුව සඳහා 2022 වර්ෂයේ වයික්කාල කොට්ඨාසය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන යෙදවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ඉල්ලීමට අදාලව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී

## 04. කාරක සභා වාර්තා සලකා බැලීම.

i. 2022.02.22/ 2022.03.02 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සලකා බැලීම.

ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව 2022.02.22 දින පැවති කමිටු වාර්තාවේ අංක 02 මුදල් හා ප්‍රතිපත්ති කටයුතු යටතේ අංක 3හි " මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් ආවරණ අනුමැතිය ලබාදෙන ලදී." ලෙස සඳහන් වන බවත් එය නිවැරදිදැයිද විමසා සිටින ලදී.ගෙවීම් සියල්ල ආවරණ අනුමැතියට යටත්ව සිදු කර කමිටුවට පැමිණි පසුව ඒවා අනුමත කරන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එය ආවරණ අනුමැතිය ලෙස නොව "මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමැතිය ලබාදෙන ලදී " ලෙස සංශෝධනය විය යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 22

2022.02.22/ 2022.03.02 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතාගේ සහ ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

ii. 2022.01.07 /2022.01.21 හා 2022.02.03 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සලකා බැලීම.

ගරු මන්ත්රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ප්‍රිමික්ස් ක්‍රමයට සකස් කල මාර්ග වලට මාස 02කට පමණ පසුව මුළු තාර අතුරා ගතයුතු බවත්,එවා මන්ත්‍රී ප්‍රතිපාදන වලින් සිදු කර ගැනීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

එක් මාර්ගයක්වත් තම කොට්ඨාසයේ ප්‍රිමික්ස් නොකල බව ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

චිප්ස්ගල් නොමැතිව තිබූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම කොම්පෝස්ට් අංගණය පිළිබඳ කතා කිරීමේදී ගරු අමාත්‍ය රොෂාන් රණසිංහ මැතිතුමා විදේශගතව සිට පැමිණ ඇති බවත්, එතුමා මෙහි සම්පූර්ණ වාර්තාව ඉල්ලා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.එක්කෝටි දස ලක්ෂයක වැඩ කොටසක් කොන්ත්‍රාත්කරු සිදු කර ඇති බවත්, පලාත් පාලන අමාත්‍යාංශය මඟින් දෙකෝටි තිස් ලක්ෂයක සියළුම වැඩ කොටස සිදු කරන ලෙසට පවසන බවත්, ඔවුන් මුදල් කොටස් වශයෙන් ලබාදෙන බැවින් සැප්තැම්බර් මස ඔවුන් මුදල් ලබාදෙන බව පැවසූ බවත් ඒ සඳහා අනුමැතියක් අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී. මෙහි සම්පූර්ණ තොරතුරු ඊළඟ මහා සභාවට ඉදිරිපත් කරන බවද ප්‍රකාශ කරන ලදී. අද වන විට ලක්ෂ 48ක් සභාව මඟින් ගෙවා ඇති බවද ඒ සඳහා මුදල ලබන සතිය වන විට

ලැබෙන බවත්, නැවත එම මුදල කොන්ත්‍රාත්කරුට ලබා දී ඉතිරි වැඩ කොටස සිදු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.

කොන්ත්‍රාත්කරු මුදල රැගෙන මෙය සිදු කිරීම පැහැර හරීවී දැයි නොදන්නා බවත්, දැනටත් යකඩ කොටස් තැන තැන දමා ඇති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

අද වන විට කණු නග්ගා ඇති බවත්, වහලය ගැසීමට මුදලක් අවශ්‍ය බව කොන්ත්‍රාත්කරු පවසන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය අත්‍යාවශ්‍ය කටයුත්තක් බවත්, මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමේ කොන්දේසිය මත මුදල් යොදවමුයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව කොම්පෝස්ට අංගණය මේ වන විට පලාත් සභා අමාත්‍යාංශය මඟින් ඉතිරි වැඩ කොටස් වල වාර්තාව සභාවෙන් ලබා ගත් බවත්, විශේෂයෙන්ම කොම්පෝස්ට් අංගණයේ මේ වන තෙක් කර ඇති වැඩ කොටස්, වැඩ නිමකර ගෙවීම් බිල්පත් ඉදිරිපත් නොකල කොටස සහ තවදුරටත් ඉවර කලයුතු වැඩ කොටස් පිළිබඳව වෙන වෙනම වාර්තාවක් ලබා ගත් බවත් ප්‍රකාශ කරන ලදී. මේ වන තෙක් කොන්ත්‍රාත්කරුට ලක්ෂ 48ක බිලක් පමණක් ගෙවා ඇති බවත් ලක්ෂ 80කට වඩා වැඩි කොටසක් නිම කර ඇති බවද එම බිල්පත් සඳහා ඉංජිනේරුමහතාගේ අනුමැතිය ලබා ගැනීමට පමණක් ඉතිරි වී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.මෙම කටයුතු මෙලෙසම සිදුකරගෙන යන ලෙසත්, මැයි 31 වන තෙක් දින ලබාදුන් බවත්, වහලය නොගසා කිසිවක් සිදු කිරීමට නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

වැඩ නිම කල සම්පූර්ණ ගෙවීම් වාර්තාව කොපමණදැයි ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා විමසා සිටින ලදී.

ලක්ෂ 80 පමණ වන බව ලේකම්මහතා පිළිතුරු ලබා දෙන ලදී.

එසේනම් ගෙවූ ලක්ෂ හතලිස් ගණන නැවත පැමිණෙන තෙක් මෙය නොගෙවා සිටිමුයැයි ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී. 50% ගෙවා ඇති බවත්,ගිවිසුමේ ගෙවිය යුතු ප්‍රතිශතයක් තිබේදැයිද විමසා සිටින ලදී.

මුළු මුදලින් 20% ගෙවිය යුතු බව ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

මුළු මුදලින් 20% ප්‍රමාණය කොපමණද යන්න ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා විමසා සිටින ලදී.

ලක්ෂ හතලිස් ගණනක් පැමිණෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් කොන්ත්‍රාත්කරු ගිවිසුම් අත්සන් කර ඇති බැවින් 20% මැයි 31ට පෙර කොන්ත්‍රාත්කරුට ගෙවමුයැයිද ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

අමාත්‍යාංශය මඟින් සම්පූර්ණ බිල්පතම එවන ලෙසට පවසන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කොන්ත්‍රාත්කරු මුළු වටිනාකමින් 20% අත්තිකාරමක් ගෙන මෙම ව්‍යාපෘතිය ඉවර කිරීමට එකඟ වී තිබෙනම් අප වගකීම එම මුදල පලාත් පාලන අමාත්‍යාංශය මඟින් ලබාගෙන දීම බවත්,එම මුදල පලාත් පාලන අමාත්‍යාංශය මඟින් නොදුනහොත් ප්‍රාදේශීය සභාව මඟින් ලබා දීයයුතු බවත්, කොන්ත්‍රාත්කරුගේ වගකීම එය මැයි 31ට පෙර අවසන් කිරීම බවත් ඉන්පසුව ඉතිරි 80% ගෙවීම අප වගකීම බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.නගර ශාලාව පිළිබඳව කතා නොකරනුයේ එය කරගත යුතුම නිසා බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. ගොඩනැඟිලි සඳහා වියදම් කර ඉන්පසුව සේවකයින්ට පඩි ලබා දීමටත්නොහැකි වී ආයතනයේ ඉතිරි වැඩ කටයුතු වලටද මුදල් මදි වුවහොත් කුමක් සිදුවේදැයිද විමසා සිටින ලදී.

ඊළඟ මුදල් කමිටුවට අවසන් වාර්තාව රැගෙන එන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කොටසක් අවසන් කර ලිඛිතව ගෙවීම් වාර්තාවක් සාදා ඉල්ලීමක් කල යුතු බවත්, මේ පිළිබඳව නෛතික තත්වය පිළිබඳව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

ඉංජිනේරුමහතා සියළු ගෙවීම් අනුමත කල යුතු බවත්, පලාත් පාලන අමාත්‍යාංශයට යොමු කර ඒ සඳහා අවසරය පැමිණි පසුව මුදල් ගෙවන බවත්, පලාත් පාලන අමාත්‍යාංශයෙන් මුදල් නොගෙවූ බැවින් ගියවර බිල් සඳහා මුදල් කමිටුවෙන් තීරණයක් ගෙන සහා අරමුදලින් ගෙවීම් කල බවත් ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

අත්තිකාරම් මුදලක් ගෙන ව්‍යාපෘති කටයුතු කරමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මේ වන විට කර තිබෙන වැඩ කොටස පිළිබඳව වාර්තාවක් ඉංජිනේරු මහතාගේ අත්සන සහිතව ලබා ගන්නා බවත්, ඒ අනුව සාකච්ඡා කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කොන්ත්‍රාත්කරු නිසිලෙස ගිය වසරේ වැඩ කටයුතු සිදු කලේ නම් මේ වන විට එය අවසන් බවත්, මෙය කොන්ත්‍රාත්කරුගේ වරද බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඒ වන විට අමුද්‍රව්‍ය නොමැතිව රටේ ගැටළු පැවති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පසුගිය දින වල ප්‍රායෝගිකව ගැටළු පැමිණි බවත්, සිටින කොන්ත්‍රාත්කරුවන්ව අප රැකගත යුතු බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා විරුද්ධ නොවන බවත්,නමුත් ගැටළු තිබෙන බැවින් කතා කල බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව දීර්ඝ ලෙස මුදල් කමිටුවේ සාකච්ඡා කල බවත්, මුදල ප්‍රතිපූර්ණය නොවූ බවත්, එය ප්‍රතිපූර්ණය නොවී නැවත ගෙවන්නේ කෙසේදැයිද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

මෙය ගෙවීමක් නොවන බවත්,ලැබෙන මුදල ලැබුණු පසුව එය ලබාදී එම කටයුතු කලහැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

20% මුදල රජයෙන් ලබා දිය යුතු බවත්, නමුත් මෙය සාර්ථකව සිදු කර ගැනීම සඳහා එම මුදලද ලබා දීමට මුදල් කමිටුවේදී තීරණය කල බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම කොම්පෝස්ට් අංගණය සාර්ථක වුවහොත් මැයි මස සිට වැඩකටයුතු ආරම්භ කල හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන දී.

මෙම ව්‍යාපෘතිය යෝජනා කලේ මධ්‍යම රජය බැවින් මෙයට අවශ්‍ය මුදල් ලබාදිය යුතු බවත්,මුදල් දීමට නොහැකි නම් බැංකුවකින් ණයක් හෝ ලබා දිය යුතු බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.සභාව පසින් සිදු විය යුතු දෙය ගරු සභාපතිතුමා මේ වන විට සිදු කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.එම ලක්ෂ හතලිස් ගණන ගෙන්වා ගැනීමට සියළුම උත්සාහයන් ගන්නා ලෙසටද ඉල්ලා සිටින ලදී.

ඉංජිනේරු නිර්දේශයට පමණක් ගෙවීම් කිරීමට හැකි බවත් එම අවසන් වාර්තාව ඊළඟ මුදල් කමිටුවට යොමු කරන ලෙසද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ඉල්ලා සිටින ලදී.

ශ්‍රවණාගාරයේ සිවිලිමේ ඇස්තමේන්තුව කමිටුවට නොලැබුණ බව කණගාටුවෙන් පවසන බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

පසුගිය මුදල් කමිටුවට එය ඉදිරිපත් කල බවද නැවත අවශ්‍ය නම් ඉදිරි මුදල් කමිටුවට ඉදිරිපත් කරන බවද ගරුසභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| තීරණ අංක 23 |
|---|

2022.01.07 / 2022.01.21 හා 2022.02.03 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී

iii. 2022.02.24 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම.

ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පරිසර කමිටුවේදී මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා වයික්කාල මංසන්ධියේ තිබෙන අවිධිමත් මස් කඩය පිළිබඳව ඉදිරිපත් කල බවත්,එය නැවත ඉදි කිරීමට සාකච්ඡා කල බවත් ප්‍රකාශ කරන ලදී. දැනට එය ගෙනතිබෙන ටෙන්ඩර්කරු සභාවේ නිර්ණායක අනුව ඉදි කිරීමට සූදානම් බවත් ප්‍රකාශ කරන ලදී. එය වටිනා භූමියක් බවත් මහල් දෙකකින් එය ඉදි කල හැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ටෙන්ඩර්කරුට වාර්ෂිව බදු ලබාදෙන බවත්, ඔහු මස් කඩය සාදා ගන්නේනම් ක්‍රමවේදයක් සකස් කිරීමට හැකිවේයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. වසරකට වරක් බදු ලබාදෙන බවත්,නමුත් ඔහු මස් කඩය සාදා ගතහොත් දිගටම ඔහුට බදු ලබාදීමට සිදු වේයැයිද ප්‍රකාශ කරන ලදී.

ඔහුට වසර කීපයකට එය ලබාදෙමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය යෝජනාවක් ලෙස ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලෙසත්, අනුමැතියක් ගෙන මෙය සිදු කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගොඩනැඟිල්ල ඉදිකර,පුවත්පත් දැන්වීමක් පල කර එය ටෙන්ඩර් කිරීමට කැඳවූ බවත් නමුත් එය ගැනීමට කිසිවෙකු නොපැමිණි බවත්,දැනට මේ පිළිබඳව ලිපි ගොණුවක් සභාවේ තිබෙන බවත් මීට වසර 10කට පමණ පෙර මෙය සිදු වූ බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. කීමනී ක්‍රමයට මෙහිදී කටයුතු කිරීමටහැකි බවද ප්‍රකාශ කරන ලදී. පර්.10ක ප්‍රමාණයක් තිබෙන බැවින් මුළු ඉඩමම භාවිතා කර ගොඩනැඟිල්ල සෑදුවේ නම් ඉහළ මහලද බදු දීමට හැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතියක් ගෙන තබා ගනිමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඊළඟ මහා සභාවට යෝජනාවක් ලෙස එය ඉදිරිපත් කරමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 24

2022.02.24 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ සහ ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී

iv. 2022.01.28 වන දින පැවති උපදේශන කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 25

2022.01.28 වන දින පැවති උපදේශන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී

ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ සහ ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී

v. 2022.01.31 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 26

2022.01.31 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී

vi. 2022.03.04 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සලකා බැලීම

විදුලි අංශයේ මාසික වියදම ලබා දී ඇති බවත්, කිසිවෙකු ඒ පිළිබඳව කතා නොකරන බවත් ලක්ෂ 07ක් පමණ මීත්පෙර වියදම් වූ බවත්, උපාංග මිල වැඩි වුවද මේ වන විට ලක්ෂ 03ක් 04ක් පමණ වියදම අඩු වී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගිය මසට වඩා මේ මස වියදම වැඩි බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

බල්බ ගබඩාවේ තිබෙන බවත්, දෙසැම්බර් මස බල්බ 5000ක් පමණ මිලදී ගත් බවත් ගලවන සෑම බල්බයකටම වසර 02ක වගකීම් කාලයක් තිබෙන බැවින් අළුත්වැඩියා අඩු නොකරන බවත්, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ඉදිරියට යාමට හැකියාවක් තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

විදුලි බල්බ නිවීම පිළිබඳව හැකිතරම් ජනතාව දැනුවත් කරමුයැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතාගේ කොට්ඨාසයේ බල්බ 05ක් පමණක් මුළු කොට්ඨාසයටම සෑදීමට තිබූ බවත්, තමන්ට ඒ පිළිබඳව ඉතාමත් සතුටු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කල අතර ලබන සතිය වන විට එක් වාහනයක් පමණක් අළුත්වැඩියාවට යොදවන බවද ප්‍රකාශ කරන ලදී.

සෝෂාව....

සෑම කොට්ඨාසයකටම විශාල බල්බ ප්‍රමාණයක් සෑදීමට නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වර්ෂා කාලයේදී මෙය වෙනස් වන බව ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

LED බල්බය වර්ෂාවට ඔරොත්තු දෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය සභාව සතු ඉඩම් ටෙන්ඩර් කිරීමේදී ගැටළුවක් මතු වන බවත්,බ/කහටවිල වසමේ ගමේ පිරිසක් ඔවුන් ඒ පිළිබඳව කිසිඳු දැනුවත් වීමක් නොමැති බව පවසන බවත් ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී. තමන් පොදු පහසුකම් කමිටුවේද කතා කල බවත්, ගමේ එක් පිරිසක් මෙය ගැටළුවක් කරගෙන සිටින බවත්, මෙහි ක්‍රමවේදය කුමක්දැයිද විමසා

සිටින ලදී. එම දැන්වීම් පත්‍රිකාව ගමේ පල කර නොතිබුන බවත් තමන්ද එයට සම්බන්ධ බවට ඔවුන් සිතා සිටින බවද උප සභාපතිතුමාටද කතා කර තිබූ බවත් දැන්වීම් අලවා වැඩි ගණනට ටෙන්ඩරය ගියහොත් සභාවට ආදායමද පැමිණෙන බවත් ප්‍රකාශ කරන ලදී.ටෙන්ඩර්කරු මේ වන විට වචන හුවමාරුවකට ගොස් ජනතාව සමඟ ගැටළුවක්ද මතු වී ඇති බවත් නිලධාරිනියක් මෙය සිදු කර ඇති බවත් නොකල වරදකට දෝෂාරෝපණයට ලක් වීමට තමන් අකමැති බවද ප්‍රකාශ කරන ලදී.

ටෙන්ඩරයක් පැමණීමේදී එය කමිටුවට දමා පළමුව සාකච්ඡා කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පොදු පහසුකම් කමිටුවේ සාමාජිකාවක් ලෙස එය තමන්ට ලැබුණ බවත් නමුත් තමන්ට එය ගමේ ඇලවීමට නොහැකි බවත් ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

සභාවේ දේපල ටෙන්ඩර් කිරීමේදී මන්ත්‍රීවරුන් මේ පිළිබඳව දැන සිටියද වෙනම පිරිසක් විශේෂ අවධානයක් යොමු කරන බවත් ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා නිලධාරිනියක් සම්බන්ධ බවත්,ඇයට හිතවත් පුද්ගලයෙකුට කොටස් දෙකකට මෙය ලබා දී තිබූ බවත්, මේ පිළිබඳව මන්ත්‍රීවරුන් නොදැනුවත් බවත්, ග්‍රාමසේවා නිලධාරී කාර්යාලය ජනතාවට සම්බන්ධ බවත් ගමේ අදාල ඉඩම් කොටස අසල ඇලවිය යුතු බවත් ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

ගමේ වසන්ත නමැත්තෙකු තමාට කතා කල බවත්, එහිදී තමන් කොට්ඨාසය භාර මන්ත්‍රීතුමිය සමඟ කතා කරගන්නා ලෙසට පැවසූ බවත් ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ප්‍රකාශ කරන ලදී.

අදාල කොට්ඨාසයේ පොදු ස්ථාන කීපයක දැන්වීම ප්‍රදර්ශනය කරමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

එය පොදු පහසුකම් කමිටුවෙන්ම නිරීක්ෂණය කරන ලෙසටත්,ටෙන්ඩර් ගැනීමට පැමිණෙන ඕනෑම කෙනෙකුට තමන් ටෙන්ඩරය ලබාදෙන බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කර ලදී.

මෙහිදී තරඟකාරීත්වයක් ඇති කරන ලෙස ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

ටෙන්ඩර් නොගන්නා දේපල ටෙන්ඩර් ගන්නා ඕනෑම කෙනෙකුට ලබා දෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අදාල පාර්ශවය සමඟ සාකච්ඡා කර මෙම ගැටළුව විසඳන ලෙස ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ප්‍රකාශ කරන ලදී.

දංකොටුව පොදු වෙළඳපොලේ මාළු මාකට් 1ක අසල වහලය කැඩී ඇති බවත්, එය සුළඟට ලෙල දෙන බවත් එයට ඉක්මනින් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් ඒ සඳහා හැකි ඉක්මනින් අවශ්‍ය කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 27

2022.03.04 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී

## 05.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.

**i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2021 නොවැම්බර් / 2021 දෙසැම්බර්**

**ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය -2021 නොවැම්බර් / 2021 දෙසැම්බර්**

**ගෙවීම් සාරාංශය යටතේ විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත යටත් අයවැය කෙටුම්පතේ රු.2,458,000.00ක් තිබෙන බවත් නමුත් මෙම වාර්තාවේ රු.2,879,152.04ක් ගෙවා ඇති බවත් එම වැඩි වීමට හේතුව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.**

**මෙය මුදල් කමිටුවේදී සොයා බලා පවසන බව ගරුසභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**ප්‍රාග්ධන කොපමණ තිබේදැයිද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී. එක්කෝටි විසි දෙලක්ෂයක් තිබෙන බවත්, මාර්ග වලින් මුදල් පැමිණියේදැයිද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.**

**දෙවරක් මුදල් පැමිණිය බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**ඒ සඳහා සභාවෙන් කොපමණ මුදල් ගෙවා තිබේදැයිද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.**

**කෝටි 2 ½ ක් ගෙවා ඇති බවත්, සියළුම මුදල් නොපැමිණිය බවත් සම්පූර්ණ වාර්තා ඊළඟ මුදල් කමිටුවට ලබා දෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**විශ්‍රාම වැටුපේ මුදල් වැඩි වීමක් තිබෙන බවත්, එහිදී පෙර ගණනය කිරීමේ වෙනසක්ද පවතින බවත්, සියළු විශ්‍රාමිකයින්ට රාජ්‍ය අයවැයේ වැඩිවීම හා ඇප ගණනය අනුව වෙනසක් පවතින බවත්, ඒ අනුව සංඛ්‍යාලේඛණ වල වෙනසක් තිබෙන බවත්** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ලේකම්මහතා විසින් සියල්ල සකස් කර හිඟ ගෙවීමට තිබූ සියල්ල ගෙවා දැමූ බවත් ප්‍රකාශ කරන ලදී.

**කෙටුම්පතේ ප්‍රාග්ධන ආදායම බිංදුව බවත්,දෙසැම්බර් 31 දින වන විට එය රු.එක්කෝටි විසිදෙලක්ෂයක් ලැබී තිබෙන බවත්, එය අයවැයේ සඳහන් වී නොමැති බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.**

තීරණ අංක 28

2021 නොවැම්බර් මස සහ දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය හා 2021 නොවැම්බර් මස සහ දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය පිළිබඳ වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

**iii. 2022 පෙබරවාරි මස ඉන්ධන හා අළුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව සලකා බලන ලදී.**

## 06. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

(i) ගරු උප සභාපති ආර් .ඒ. නිලංක සඳකැල් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව, සභා අරමුදලින් මිලදී ගත් නව ක්‍රීඩාංගනය විවෘත කිරීම හා ජනතා සතු කිරීම මෙම මස 27 වන දින තිබෙන බවත්, ඊට ප්‍රථම එම ක්‍රීඩාංගනය නමින් නාම පුවරුව සහ ඵලකය සකස් කර ලබා දීමට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

(ii). ගරු මන්ත්‍රී ඩී. එල්. අමල් සුරංග මහතා, ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනිමෙන් පසුව , සෙන්දිරියාමුල්ල වසම සහ ඉ/බූජ්ජම්පොල වසම එකට තිබෙන බවත්,එහි සුසාන භූමිය තිබෙන බවත්, එය 90% පමණ ඇටඹගහවත්ත ජනපදය හා සෙන්දිරියාමුල්ල ජනතාව භාවිතා කරන බවත් ප්‍රකාශ කල අතර එහි මායිම අවසානයේ හොර ගස් කිපයක් තිබෙන බවත් එම ගස් අල්ලාගෙන අසල්වැසියා වැට ගසා ඇති බවත් ප්‍රකාශ කරන ලදි. ජනතාවගේද ඉල්ලීමක් තිබෙන බවත් මේ සඳහා ඉක්මනින් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසද ඉල්ලා සිටින ලදි.

සුසාන භූමි ගැසට් එකක් මගින් සභාවට ලබාදෙන ලෙසට ඉල්ලා තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

මෙම අදාළ කටයුතු සඳහා සභාවට අයිතියක් තිබේ නම් මැණුම් කටයුතු කර අල්ලාගෙන තිබෙන කොටස නැවත ලබා ගැනීමට කටයුතු කරන ලෙසත්, මෙය ලබන සතිය වන විටම සිදු කරන ලෙසද ගරු මන්ත්‍රී ඩී. එල්. අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදි.

මෙය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නම් ඒ සඳහා ලිපියක් මඟින් දැනුම් දෙන ලෙසටද තවදුරටත් ඉල්ලා සිටින ලදි.

(iii) උළු මෝල් සංගමය යැයි පවසා දික්වෙල මැටි කැනිමක් සිදු කරන බව ගරු මන්ත්‍රී ඩී. එල්. අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදි. මුදල් අය කිරිමකින් තොරව මාර්ග භාවිත කිරිම සඳහා ඔවුන්ට අවසරය ලබා දී තිබේදැයිද ගරු සභාපතිතුමාගෙන් තවදුරටත් විමසා සිටින ලදි.

ඔවුන්ව තමන් නොදන්නා බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

බලපත්‍රය රැගෙන එතැන මැටි පටවන බවත් , නමුත් කියුබ් 03 ක් යොදාගෙන එය ගොඩකිරීමට යන බවත් , එම මාර්ග වල කියුබ් 03 ක බරක් සහිත වාහන ගමන් කිරිම තහනම් බවත්, ගරු මන්ත්‍රී ඩී. එල්. අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදි.හෙට අනිද්දා වන විට කියුබ් 03 පැටවූ වාහන දහස් ගණනක් ගමන් කිරීමට යන බවත් , මාසයක් යන විට මෙම මැටි කපා අවසන් වන බැවින් හැකි ඉකිමනින් මේ සඳහා ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසද ඉල්ලා සිටින ලදී. කුරුණෑගලින් බලපත්‍රය නිකුත් කරනුයේ ගරු සභාපතිතුමාගේ අනුමැතිය සහිතව බැවින් , මේ සඳහා තැන්පතුවක් තබාගෙන කටයුතු කරන ලෙසද ඉල්ලා සිටින ලදී. එම ඉඩම ගොඩ කිරිමට විශාල වාහන යන බැවින් මාර්ග නඩත්තුවට ද මුදලක් අය කර ගන්නා ලෙසටද ප්‍රකාශ කරන ලදී.නිලධාරින් යොදවා මේ සඳහා ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසටද තවදුරටත් ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී එල්. කේ.ජගත් ප්‍රියංකර මහතා , ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනිමෙන් පසුව මීට පෙර අවස්ථා ගණනාවකම මැටි කැපීම පිළිබඳව කතා කල බවත් , දික්වෙල මැටි කැපීම පිළිබඳව කතා කළ බවත්, කුඩවිල වැව අසල රක්ෂිතයේ මැටි කැපීම පිළිබඳව කතා කල බවත් මහා සභාවේ කතා කලද එතැනට පොලිසිය යැව්වේවත් , ලිපියක් යැව්වේවත් නොමැති බවත් ප්‍රකාශ කරන ලදි. ජංකුරා වෙල ගරු මන්ත්‍රී ඩබ්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා ද කැණීම් බලපත්‍රයක් ගෙන මැටි කැපුව බවත් ,එතුමාට කිසිදිනෙක තමන් බාධා කර නොමැති බවත්, අවශ්‍ය නිත්‍යානුකූල මාර්ග ඔස්සේ එතුමා එය සිදු කරගෙන ගිය බවත් ප්‍රකාශ කරන ලදි.එම මාර්ග කාපට් මාර්ග නොවන බවත් , ඒවා බොරළු පාරවල් බවත් ප්‍රකාශ කරන ලදි. මැටිකොටුව , ඇටියාවල , ද/ ඇටියාවල , ඕතර , නර්තන ශිල්පිනි කාන්ති මහත්මියගේ නිවස පාර කිසිම බලපත්‍රයක් නොමැතිව මැටි කැපීම් සිදු වන බවත් , මේවා සඳහා ප්‍රාදේශීය සභාවේ නිර්දේශය ගත යුතු බවත්, ප්‍රකාශ කරන ලදි.මෙම උළුමෝල් හිමියන් සංගමයක් නොවන බවත්, ටෙරන්ස් නම් දංකොටුව ප්‍රදේශයේ පුද්ගලයකු හා තවත් කීපදෙනෙකු මෙය සිදු කරගෙන යන බවත් ප්‍රකාශ කරන ලදි.මෙහි පළමු බලපත්‍රය යහපාලන ආණ්ඩුව සමයේ අක්කරයක ප්‍රමාණයට ගත් බවත් මෙහි තිබෙනුයේ උළුමෝල් වලට අවශ්‍ය මැටියැයි ඔවුන් පවසන බවත්, ජනතාව දොස් නගන බැවින් මාර්ගයට ජලය ඉසීමටත් ඉඩම සම්පූර්ණයෙන් ගොඩ කළයුතු බවත්, එය අක්කර ½ න් ½ ට ගොඩ කළයුතු බවට තමන් ඉල්ලීම කළ බවත් ප්‍රකාශ කරන ලදී.පළමු හා දෙවන අක්කර ½ ගොඩ කළ බවත් මෙය තුන්වන අක්කර ½ බවත් මාර්ගය අසළ ජනතාවට මෙය ඉතාමත් කරදරකාරී බවත් ප්‍රකාශ කරන ලදී. නීත්‍යානුකූල නොවන ස්ථාන වල ලේඛණයක් ලිඛිතව ලබා දියහැකි බවත්, මේවා සඳහා වැඩපිළිවෙළක් සකස් කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. ගරු මන්ත්‍රී

ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ සභාපතිත්වයෙන් පරිසර කමිටුවක් සභාවේ තිබෙන බවත්, මෙම සියල්ල සභා පාලනයේ තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

මේවායෙහි නාම ලේඛණයක් ලබා දෙන ලෙස ගරු සභාපති තුමා ප්‍රකාශ කරන ලදී.

ඇටියාවල පන්සල ඉදිරිපිට ප්‍රධාන මාර්ගය අසලද සුමුදු නැමැත්තෙක් මැටි කපන බවත්, එය පැහැදිලිවම සභාවේ මාර්ගයක් බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.කියුබ් 03 පැටවු වාහන යාම නිසා වෙල මැද කොන්ක්‍රීට් පාර සම්පූර්ණයෙන්ම දෙකට පැලී ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. මෙය ඉතාමත් ඉක්මනින් ක්‍රියාත්මක වියයුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය පරිසර කමිටු වාර්තා බලන ලෙසත් භූ විද්‍යා සමීක්ෂණ පතල් කාර්යංශයට මෙන්ම පරිසර අමාත්‍යතුමාට ද තමන් කතා කළ බවත්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය කිසිම විටක ප්‍රාදේශීය සභාවෙන් අවසරයක් නොඉල්ලන බවත් එබැවින් මේ සඳහා මැදිහත් වීමට මාර්ගයක් සෙවූ බවත් ප්‍රකාශ කරන ලදී. පෞද්ගලික ඉඩම් හිමියන්ට කැණීම් කිරිමට අවස්ථාව ලබා දී සභාවේ මාර්ග පළුදු කර දමන බවත්, ඒවා නැවත ප්‍රතිසංස්කරණය කිරීමට සභාවට සිදුවන බැවින් මේ පිළිබඳව පරිසර කමිටුවේද සාකච්ඡා කළ බවත් ප්‍රකාශ කරන ලදී. තමන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයේ අධ්‍යක්ෂක ජනරාල්වරයාට ද මේ සම්බන්ධයෙන් කතා කළ බවත්, එම කැණීම් කරන ලිපිගොනුවට ඇතුළත් කිරීමට ප්‍රාදේශීය සභාවේ ලියවිල්ලක් අවශ්‍ය බව තමන් පැවසූ විට එයට පරිසර අමාත්‍යතුමාද එකඟ වූ බවත් ප්‍රකාශ කරන ලදී. මන්ත්‍රීතුමා මීන් පෙර පැවසූ දෙය සාධාරණ බවත්,ව්‍යාපාර හොඳ විදියට සිදුවිය යුතු බවත්, ප්‍රාදේශීය සභා ලාංඡනයේ ද උළු කර්මාන්තය, පොල් කර්මාන්තය හා ධීවර කර්මාන්තය තිබෙන බවත්, නමුත් ඒවාට ප්‍රාදේශීය සභාවේ මාර්ග බිලි දීමට නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. තමන් ඇතුළු මන්ත්‍රීවරුන්ද උළු කර්මාන්තයේ යෙදෙන බැවින් අනිවාර්යෙන්ම මධ්‍යම පරිසර අධිකාරියෙන් හෝ පළාත් පරිසර අධිකාරියෙන් හෝ අවසර ගෙන කැණීම් කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයේ අවසර ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී. මෙම ගැටළුව කමිටුවට යොමු කරන ලෙසද ඉල්ලා සිටින ලදී.

මාර්ගය පළුදු වුවහොත් එයට ගෙවීමට මුදල් තැන්පතුවත් ලබාගනිමු යැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී. එම ලියවිල්ල භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයට දුන්විට අවසර ලබාදෙන ක්‍රමවේදයක් සකස් කළ යුතු බවද ප්‍රකාශ කරන ලදී. තමන් මෙයට මැදිහත් වීමට අවස්ථාව පෙන්වූ බවද ප්‍රකාශ කරන ලදී. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය ලිඛිතවම සභාවේ නිර්දේශයක් ගන්නා ලෙසට දන්වා ඇති බවද ප්‍රකාශ කරන ලදී.

මෙය හැකි ඉක්මනින් සිදු කරන ලෙසට ගරු මන්ත්‍රී ඩී. එල්. අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

සෝෂාව...............

සභාවේ අංක 127 හා අංක 128 වගන්ති සැලකීමේදී සුසාන භූමි වල බලධාරියා වනුයේ ප්‍රාදේශීය සභාව බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. එබැවින් නගරශාලා හා සුසාන භූමි සියල්ලත් අත්පත් කර ගැනීමේ අයිතිය සභාව සතුව තිබෙන බවත් මෙම වගන්තිය යටතේ සියල්ලන්ටම නිවේදන යොමු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

(iv) උ/ ඇටියාවල, මීගහවෙල ජනපදය පහත් බිමක සාදා ඇති බැවින් අඩි 06 ක පමණ කාණුවක් තිබෙන බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. එහි මල්රාජ් මහතාගේ ඉඩමක්ද ප/ දුම්මලකොටුවේ තිබෙන බැවින් ඒ හරහා අඩි 06 ක පමණ ඇළ මාර්ගයක් පැමිණෙන බවත් ඊළඟට තිබෙන කොටසේ පළල අඩි 1 ½ පමණ අඩු වී යන බවත් එම ස්ථානයේ අළුතින් ඉඩමක් කොටස් කර විකුණන බවත්, එහිදි පහත් බිමක් ගොඩකර මෙය සිදු කරන බවත්, ඇළ මාර්ගය සම්බන්ධයෙන් කිසිදු ප්‍රමිතියකට ලක් වී නොමැති බව ජනතාව පවසන බවද ප්‍රකාශ කරන ලදී.ඒ සම්බන්ධයෙන් අවසර දීමකදී ජලය බැස යන ඇළ දැනටත් හිර වී නිතරම සභාව මඟින් සුද්ද පවිත්‍ර කිරීමට සිදු වී ඇති බවත්, ඇළ මාර්ගය විවෘත කර ගැනීමට කටයුතු කරන ලෙසද ඉල්ලා සිටින ලදී. නැතිනම් එම ඉඩමේ පදිංචි වන පිරිසට මෙන්ම උ/ ඇටියාවල, මීගහවෙල ජනතාවටද විශාල ගැටළුවක් මතු වන බවද ප්‍රකාශ කරන ලදී. ඉඩම කැබලි කිරීමේදී එම ඇළ මාර්ගය

සම්බන්ධයෙන් ඔවුන් ගෙන ඇති පියවර පිළිබඳ පැහැදිලිතාවයක් නොමැති බැවින්, ඒ සම්බන්ධයෙන් අවසර ලබා දී ඇති ආකාරය ද මෙහිදී විමසා සිටින ලදී.

එය තමන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මොහොට්ටිමුල්ල ප්‍රදේශයේ සභාව විසින් නැවතු කුළුණක් සම්බන්ධයෙන් ජනාධිපති විමර්ශන ඒකකයේ නිලධාරියෙකු පැමිණ එතුමාව එය නිරීක්ෂණයට එවූ බවත්, එය සභාව මඟින් නතර කලද පාසල් දරුවන්ගේ අධ්‍යාපන වැඩ කටයුතු සඳහා සිග්නල් නොමැති බව පවසා ඉල්ලීමක් කර තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.

පසුගිය කාලයේ යම් යම් අපහසුතා ඇති වූ බවත්, සිග්නල් නොමැති ගැටළුවක් තිබෙන බවත්, එය කර්මාන්ත පුරයේ පිට්ටනියේ ස්ථාපිත කිරීමට කටයුතු කරන ලෙසටද එවිට මෙම ගැටළුව අවසන් වන බවද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී

ලබන සතියේ ඔවුන් පැමිණෙන බැවින් , කොට්ඨාස මන්ත්‍රීතුමාවද මේ සඳහා යොමු කරන බව තමන් පැවසූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.දරුවන් විසින් Online ඉගෙනීමේ වැඩ කටයුතු කර ගැනීමට නොහැකි බව පවසා ලිපියක්ද තිබෙන බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.ලබන සතිය වනවිට ඔවුන්ව යොමු කරන බව කොට්ඨාස භාර මන්ත්‍රීතුමා වන ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාට දැනුම් දෙන ලදී.

තමන්ගේ විරුද්ධතාවයක් නොව ගමේ එක් ජනතා කොටසක් මේ සඳහා විරුද්ධ වූ බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. ඊට මීටර් 300 පමණ එහායින් පිට්ටනියේ මෙය ඉදි කළේ නම් ගැටළුවක් නොවන බවද ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව......................

(v) විදුලි බල මණ්ඩලයේ කොන්ක්‍රීට් කණු මාර්ගය දෙපස ස්ථානගත කර තබන බවත්, ලුණුවිල වැව අසල ද එලෙස කොන්ක්‍රීට් කණු 50 ක් පමණ ස්ථානගත කර තබා ඇතිමුත් එතැන පොළොව ශක්තිමත් නොමැති බවද එබැවින් එම ස්ථානයේ ඒවා ස්ථානගත කර නොතබන ලෙසටද ඔවුන්ට දැනුම් දෙන ලෙස ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

ඉඩකඩ තිබෙන බැවින් එතැන ස්ථානගත කර තබන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පිට්ටනියේ වැනි සුදුසු ස්ථානයක ඒවා ස්ථානගත කරන ලෙසට පවසන ලෙස ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් විදුලි බල මණ්ඩලය මේ සම්බන්ධයෙන් දැනුවත් කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

(vi) සෞභාග්‍යයේ දැක්ම යටතේ රැකියා ගණනාවක් ලබා දී ඇති බවත්, පෙට්‍රල් ඩීසල් නොමැති බැවින් පෝලිම්වල සිටීමට සිදු වී ඇති බවත්, මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කර මන්ත්‍රීවරුන්ට ඩීසල් ලීටර් කීපයක් පෝලිම්වල නොතබා ලබා දෙන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.සුසන්න ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී මන්ත්‍රීවරුන් විවිධ අදහස් පල කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.